මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2025

9 ශ්‍රේණිය

**පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

- සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

## I කොටස

01. සුරක්ෂිත ජන සමාජයක් සඳහා .......................... ප්‍රබල දායකත්වයක් ලබා දෙති.

02. සමාජ, ආර්ථික, සංස්කෘතික පරිසරවලට ගැලපෙන ලෙස තාක්ෂණය යොදා ගැනීම .......................... ලෙස හඳුන්වයි.

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය .......................... මත ඔවුන් විසින් ගොඩනගා ගනු ලබයි.

04. ප්‍රාදේශීය අවශ්‍යතා ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීමට පිහිටුවා ඇති ආයතන විශේෂය .......................... ලෙස හැඳින්වේ.

05. අයිතිවාසිකම් භුක්ති විඳින පුරවැසියෙකු ලෙස සමාජයට ඉටු කල යුතු යුතුකමක් ලෙස .......................... දැක්විය හැකිය.

**(පළාත් පාලන ආයතන / දූරදර්ශී යහපත් පුද්ගලයන් / යෝගය තාක්ෂණය / මහජනතා කැමැත්ත මත / පරිසරය සුරකිමු තාක්ෂණය / ත්‍රිවිධ හමුදාව)**

- අංක 06 - 10 දක්වා නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

06. රටක මූලික නීතිය ලෙස හඳුන්වන්නේ,

1) අපරාධ නීතිය
2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
3) දේශීය නීතිය
4) සිවිල් නීතිය

07. ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන බලපෑමක් වන්නේ,

1) ලෙඩ වලින් ආරක්ෂිතවීම
2) නාගරීකරණය අඩුවීම
3) යහපත් පරිභෝජන රටාවන්ට හුරුවීම
4) මානසික ආතතිය ඇතිවීම

08. ද්වී පක්ෂ ක්‍රියාත්මක වන රටවල් වන්නේ,

1) කියුබාව, ඇමරිකාව
2) ලංකාව, උතුරු කොරියාව
3) එංගලන්තය, ඇමරිකාව
4) ඉන්දියාව, කියුබාව

09. මහනගර සභාවේ පරිපාලන නිලධාරියා වන්නේ,

1) ලේකම්
2) නාගරික කොමසාරිස්
3) පුරපති
4) සභාපති

10. දේශීය ආවේණික සතෙකු නොවන්නේ,

1) පතිරණ සාලයා
2) අං කටුස්සා
3) සිවුරු හොරා
4) කළු වඳුරා

- අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

11. ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ නීතිපපතිතුමාය. (   )

12. ලාංකිකයන් වෙනුවෙන් පළමුව තේරීපත් වූ උගත් ලාංකිකයා වන්නේ පොන්නම්බලම් අරුණාචලම් මහතාය. (   )

13. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ප්‍රධාන නගර ලෙස ග්‍රීසියේ ඇතැන්ස් හා ස්පාටා නගර හඳුන්වයි. (   )

14. ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහනගර සභා ලෙස ගාල්ල හා යාපනය හඳුන්වයි. (   )

15. 'සියරට දේ සිරිසැප දේ' කියමන තහවුරු කළ පුද්ගලයෙකු ලෙස මහත්මා ගාන්ධිතුමා හඳුනාගත හැක. (   )

- 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා (අ) හා (ආ) තීරු නිවැරදිව ගලපා හිස්තැන මත ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.

| | | |
|---|---|---|
| 16. මව විසින් ශ්‍රේෂ්ඨයෙකු බවට පත් කළ මහා පල්මෝඩයා ලෙස තමන්ව හැඳින්වූයේ, | (   ) | A.සමානුපාත නියෝජනය |
| 17. නීත්‍යානුකුල මාර්ග වලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත් වීම | (   ) | B. එකලස් කිරීම |
| 18. මැතිවරණයකදී පක්ෂයක්, කණ්ඩායමක් ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව මන්ත්‍රීධූර ලබා දීම | (   ) | C. නිෂ්පාදන විවිධාංගීකරණය |
| 19. කාර්මික අංශයේ සිදු වූ නව වෙනස්වීම් | (   ) | D. යහජීවනය |
| 20. දියර තේ, හරිත තේ ලෙස තේ වර්ග වෙළඳපොලේ දක්නට ලැබීමෙන් සනාථ වන්නේ, | (   ) | E. අයිසෙක් නිවුටන් |
| | | F. තෝමස් අල්වා එඩිසන් |

(ල. 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.

1.

i. නීතිය බලාත්මක කරන ආයතන 2 ක් ලියා දක්වන්න.

ii. ආරවුලක් සමථ මණ්ඩලයට යොමු කළ හැකි ක්‍රම 2ක් ලියා දක්වන්න.

iii. ආර්ථිකයක වෙනස්වීම් සිදුවන අංශ 2ක් දක්වන්න.

iv. සහජීවන ගුණාංග 2ක් නම් කරන්න.

v. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප 2 මොනවාද?

vi. දේශපාලන පක්ෂ 2ක් දක්වන්න.

vii. පළාත් පාලන ආයතන 2ක් නම් කරන්න.

viii. ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක 2ක් සඳහන් කරන්න.

ix. වත්මන් රැකියා වෙළඳපොලේ ප්‍රධාන අංශ 2 දක්වන්න.

x. වත්මන් අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ 2 සඳහන් කරන්න.

(ල . 20)

2.

i. සමාජ සුරක්ෂිතතාවය යන්න හඳුන්වන්න. (ල. 2)

ii. සමාජ සුරක්ෂිත කෙරෙහි බලපාන ආයතන 03ක් නම් කරන්න. (ල. 3)

iii. ඉන් එක ආයතනයකින් සමාජ සුරක්ෂිතතාවයට ඉටු විය යුතු කාර්ය 05ක් ලියන්න

(ල. 5)

3.

i. තාක්ෂණය යනු කුමක්ද? (ල. 2)

ii. තාක්ෂණය වෙනස්වීමත් සමඟ ඇතිවන සමාජ වෙනස්වීම් 3ක් ලියන්න. (ල. 3)

iii. තාක්‍ෂණය වෙනස්වීම් නිසා ඇති වන හිතකර බලපෑම් 03ක් හා අහිතකර බලපෑම් 05 සඳහන් කරන්න. (ල. 5)

4.

i. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ පුද්ගලයින් 02කු නම් කරන්න. (ල. 2)

ii. ප්‍රජාතන්ත්‍රවාදයේ අංග ලක්ෂණ 03ක් නම් කරන්න. (ල. 3)

iii. රටකට ජාතික ප්‍රතිපත්තියක් පැවතීමෙන් අත්වන යහපත් ප්‍රතිඵල 5ක් සඳහන් කරන්න.


(ල. 5)

5.

i. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේදී සැලකිල්ලට ගන්නා නිර්ණායක 2ක් දක්වන්න. (ල. 2)

ii. පළාත් පාලන ආයතන තුළින් ඉටු කරන සේවා 3ක් ලියන්න. (ල. 3)

iii. පහත දැක්වෙන මහනගර සභාවක සංවිධාන ව්‍යුහය සම්පූර්ණ කරන්න. (ල. 5)




6.

i. සමුපකාර ව්‍යාපාරයේ පියා සඳහන් කර ආදර්ශ පාඨය ලියා දක්වන්න. (ල. 2)

ii. පාසල් සමුපකාර සමිති මඟින් දරුවන්ට ලබා ගත හැකි සේවාවන් 2ක් ලියන්න. (ල. 3)

iii. දේශීයත්වය පිළිබඳ පහත තොරතුරු සම්පූර්ණ කරන්න. (ල. 5)

a) දේශීය සංස්කෘති 2ක් නම් කරන්න.

b) දේශීය නිෂ්පාදන 2ක් නම් කරන්න.

c) දේශීය ඖෂධ 2ක් නම් කරන්න.

d) දේශීය ශාක 2ක් නම් කරන්න.

e) දේශීය සතුන් 2ක් නම් කරන්න.